00036

**ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලය**

**අධ්‍යාපන පීඨය**

**අධ්‍යාපනවේදී (නාට්‍ය හා රංගකලා) උපාධි වැඩසටහන -පස්වන මට්ටම 2014/2015**

**අවසාන පරීක්ෂණය - 2016**

**නාට්‍ය හා රංගකලාව ඉගැන්වීම සඳහා අධ්‍යාපන තාක්ෂණය – ESU3327**

**කාලය : පැය (03) තුනයි.**

---

**දිනය - 2016 අප්‍රේල් 08** **වේලාව - ප.ව.01.30 - ප.ව.04.30 දක්වා**

---

**1 වන කොටසේ සියලුම ප්‍රශ්නවලට ද, 2 වන කොටසේ ඕනෑම ප්‍රශ්න තුනකට (03) ද පිළිතුරු සපයන්න.**

## <u>1 වන කොටස</u>

01. i. ඉගෙනුම්-ඉගැන්වීම් ක්‍රියාවලියේදී තාක්ෂණය භාවිතයෙන් ඉගෙනුම ලබන්නන් ඉගෙනුම පහසු කර ගන්නා ආකාරය නිදසුන් දෙකක් (02) දක්වමින් කෙටියෙන් විස්තර කරන්න.

ii. හොඳ පැවරුමක ඇති ප්‍රධාන ලක්ෂණ පහක් (05) නම් කරන්න.

iii. ඉගැන්වීමේ ශිල්පීය ක්‍රමවල වැදගත්කම නිදසුන් දෙකක් (02) ඇසුරින් පැහැදිලි කරන්න.

iv. ඉගෙනුම්-ඉගැන්වීම් ක්‍රියාවලියේදී පෙළපොත් භාවිත කරන විට ගුරුවරයෙකු විසින් සැළකිළිමත් විය යුතු කරුණු පහක් (05) සඳහන් කරන්න.

v. ක්ෂේත්‍ර චාරිකාවල ඇති අධ්‍යාපනික වැදගත්කම කරුණු තුනක් (03) දක්වමින් කෙටියෙන් පෙන්වා දෙන්න.

vi. ගුරුවරයකුට, පාඩම් සැලසුම් කිරීමේ ඇති ප්‍රයෝජන තුනක් (03) සඳහන් කරන්න.

vii. ‘අරමුණ’ හා ‘නිපුණතාව’ අතර වෙනස නිදසුනක් ඇසුරෙන් පැහැදිලි කරන්න.

viii. ඉගෙනුම්-ඉගැන්වීම් ක්‍රියාවලියේ දී අන්තර්ජාලය භාවිත කරන විට ගුරුවරුන් අනුගමනය කළයුතු ආරක්ෂාකාරී පියවර තුනක් (03) කෙටියෙන් පැහැදිලි කරන්න.

(ලකුණු 5 x 8 = 40)

## 2 වන කොටස

09. (i) ඉගෙනුම්-ඉගැන්වීම් ක්‍රියාවලියේ දී ශිෂ්‍යයාට ලබා දිය හැකි විවිධ අන්දමේ අත්දැකීම් ඩේල්ගේ අත්දැකීම කේතුව ඇසුරින් කෙටියෙන් විස්තර (ලකුණු 05)

(ii) ශිෂ්‍යයන්ගේ නිර්මාණශීලි චින්තනය අවදි කිරීම සඳහා ඉහත කේතුවේ කුමන අත්දැකීම් යොදා ගත හැකි දැයි සුදුසු නිදසුන් යොදාගෙන පැහැදිලි කරන්න.

(ලකුණු 10)

10. (i) නාට්‍ය හා රංගකලාව ඉගැන්වීම සඳහා යොදා ගත හැකි සුවිශේෂී ඉගැන්වීම් ක්‍රම හතරක් (04) නම් කරන්න. (ලකුණු 08)

(ii) ඉන් ඕනෑම ක්‍රමයක් පිළිබඳව විස්තරයක් කරන්න. (ලකුණු 07)

11. (i) ඉගෙනුම් ආධාරක යනු කුමක්දැයි ඔබේ වචනයෙන් ලියා දක්වන්න. (ලකුණු 03)

(ii) ඉගෙනුම් ආධාරක භාවිතයේදී සැලකිලිමත් විය යුතු කරුණු තුනක් (03) දක්වන්න.

(ලකුණු 03)

(iii) 10 වන ශ්‍රේණියට ඉගැන්වීම සඳහා 'සොකරි' හෝ 'කෝලම්' ජන නාට්‍යය ඔබට ලැබුණේ යැයි සිතන්න. මෙම පාඩම ඉගැන්වීම සඳහා ඔබ යොදා ගන්නා ඉගෙනුම් ආධාරක තුනක් (03) දක්වන්න. (ලකුණු 03)

(iv) ඔබගේ තෝරා ගැනීමට හේතු දක්වන්න. (ලකුණු 05)

12. "නාට්‍ය හා රංගකලා විෂයයේ නාට්‍ය ගීත සඳහා ශිෂ්‍යයන්ගේ ඉහළ රුචිකත්වයක් ඇත."

(i) කිසියම් ශ්‍රේණියක් සඳහා නාට්‍ය ගීත ඉගැන්වීමේ දී ඔබ මූලිකව ම අවධානය යොමු කරන කරුණු මොනවාදැයි දක්වන්න. (අවම වශයෙන් කරුණු තුනක්වත් (03) ඇතුළත් විය යුතුයි.) (ලකුණු 07)

(ii) නාට්‍ය ගීත ගායනය සඳහා ශිෂ්‍යයන්ගේ හඬ උච්චාරණය වැඩිදියුණු කිරීම සඳහා ඔබ යොදා ගන්නා ක්‍රමෝපායයන් දෙකක් (02) විස්තර කරන්න.

(ලකුණු 08)

13. පුද්ගලයන් සමස්ත සංවර්ධනය සඳහා සෞන්දර්යය විෂයයන්ගෙන් ලැබෙන දායකත්වය නිදසුන් සමඟින් සාකච්ඡා කරන්න. (ලකුණු 15)

හිමිකම් ඇවිරිණි.